# 2.15 මහාවංසයේ මොග්ගල්ලාන සංස්කරණය හෙවත් කාම්බෝජ මහාවංසය පිළිබඳ විමර්ශනයක්

ධම්මිකා කුමාරි මනතුංග
ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

මොග්ගල්ලාන සංස්කරණය හෙවත් කාම්බෝජ මහාවංසය යනු මහාවංසයේ ප්‍රථම කොටසට කරන ලද සංස්කරණ කීපයෙන් එකකි. ක්‍රි. ව. 12 වන සියවසේදී පමණ රචනාවන්නට ඇතැයි සැලකෙන මෙම කෘතියෙහි දැනට හමු වී ඇති සියලු ම පුස්කොළ පිටපත් කාම්බෝජ අක්ෂරයෙන් ලියා ඇති බැවින්, මෙය කාම්බෝජ මහාවංසය නමින් ද හඳුන්වයි.

මෙම කෘතිය, ක්‍රි. ව. 5 වන සියවසේ මහානාම හිමියන් විසින් පාලි බසින් රචිත මහාවංසයේ ප්‍රථම කොටස එනම් 1 වන පරිච්ඡේදයේ සිට 37 වන පරිච්ඡේදය දක්වා වූ කොටසට ම අදාලව කරන ලද නව සංස්කරණයක් වුවත්, මහානාම හිමිගේ කෘතියට වඩා ඓතිහාසික තොරතුරු ඉදිරිපත් කිරීම සහ විස්තර කිරීම අතින් වඩාත් ඉදිරියෙන් සිටින බව පෙනී යයි. මහානාම හිමිගේ මහාවංසයේ ප්‍රථම කොටසට අන්තර්ගත වන ගාථා සංඛ්‍යාව 2886 කි. නමුත් මොග්ගල්ලාන සංස්කරණයෙහි ගාථා 5772 ක් ඇතුළත් වේ. ඒ අනුව මුල් කෘතියට වඩා ගාථා 2886 ක් මොග්ගල්ලාන සංස්කරණයේ අන්තර්ගත වේ. කෘති දෙකේ ම අන්තර්ගත මූලික කරුණු හා පරිච්ඡේද වෙන් කිරීම එක හා සමාන වුවත් මුල් කෘතියෙන් නොලැබෙන බොහෝ ඓතිහාසික තොරතුරු ද, දැනට ඇති තොරතුරු වඩාත් විස්තර සහිතව ද මේ මගින් ලබාගත හැකි ය.

මෙම අධ්‍යයනයේදී මාගේ අවධානය යොමු වුයේ මහාවංසයේ මොග්ගල්ලාන සංස්කරණයෙන් ලබා ගත හැකි එම ඓතිහාසික තොරතුරු හා කෘතියේ වැදගත්කම සලකා බැලීමයි.